www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලන්ඩනයේ ත්‍රස්ත බෝම්බ ප්‍රහාර: දේශපාලන අපරාධයක්

## London terror bombings: a political crime

**කර්තෘ මන්ඩලය විසිනි**
**2005 ජුලි 8**

දුසිම් ගනනාවකගේ ජීවිත බිලිගෙන තවත් සිය ගනනකට තුවාල සිදු කොට ඇති ලන්ඩනයේ ත්‍රස්ත බෝම්බ ප්‍රහාර *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මුලුමනින් ම හෙලා දකී. මිය ගිය අයගේත් තුවාල වූ අයගේත් පවුල් වෙත ද තමන් ලද මෙම අත්දැකීම මගින් කම්පනයට හා බලගතු චිත්ත වේදනාවන්ට පාත්‍ර වී ඇති සියල්ලන් වෙත ද අපි අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටිමු.

යලිදු වරක්, සිය ආන්ඩු විසින් කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් කිසිදු වගකීමකට බැඳී නැති ජනයා මරනයට, තුවාලවලට හා වේදනාවන්ට පාත්‍ර වීම පිලිබඳ භයංකර දර්ශනයන් ලෝකයා හමුවේ දිග හැරෙමින් පවතී. ජනාකීර්න කලබලකාරී වේලාවක බෝම්බ පිපිරීමට සැලසුම් කොට තිබුනේ ජනයා රැකියා සඳහා යමින් සිටි, සිය දරුවන් පාසල් කරා ගෙන යමින් සිටි හෝ අවට නැරඹීමේ යෙදෙමින් සිටි අවස්ථාවක උපරිම සංඛ්‍යාවක් ඝාතනය කරනු හා අංගච්ඡේදනයට ලක් කරනු පිනිස ය.

මරනයට පත් වූ හා තුවාල ලැබූවන් පිලිබඳ අවසන් ගනන් හිලව් තවමත් නොදන්නා නමුත් ඒ පිලිබඳ තක්සේරු ඉහල නගිමින් පවතී.

ජුලි 7 දා පෙ.ව. 8.51ට ඇරඹී බෝම්බ හතරක් එකකට පසුව එකක් වසයෙන් ඉතා කෙටි කාල පරාසයකින් යුතුව පිපිරුනි. ඉන් තුනක් ලන්ඩන් උමං දුම්රිය ජාලය තුල දී පුපුරා ගිය අතර තවෙකක් මගීන්ගෙන් පිරී තිබූ තට්ටු දෙකේ බස් රථයක් තුල දී පිපිරුනි. ඇල්ඩ්ගේට් හා ලිවර්පූල් ස්ට්‍රීට් අතරත් රසල් ස්ක්වයාර් සහ කිංග්ස් ක්‍රොස් අතරත් ගමන් කරමින් සිටි දුම්රියවලට සහ ඒඩ්ග්වෙයාර් උමං දුම්රිය පොලේ නවතා තිබූ එක් දුම්රියකට හානි සිදු විය. හැක්නී සිට මාබල් ආර්ච් දක්වා මගීන් රැගෙන යමින් සිටි බස් රථයක ඉහල තට්ටුව ඉරී ගියේ ය.

නිල මූලාශ්‍රයන්ට අනුව, උමං දුම්රිය ජාලයේ 35 දෙනෙක් ඝාතනයට ලක්ව බස් රියේ පිපිරුනු බෝම්බයෙන් දෙදෙනෙක් මිය ගිය අතර පිපිරීමෙන් හටගත් තුවාල හේතු කොට ගෙන එක් අයෙක් රෝහලේ දී මිය ගියේ ය. අඩු ගනනේ 700කට තුවාල සිදු වී තිබෙන අතර ඉන් 45කට බරපතල ය. ගනනාවකට අතපය අහිමිව ඇති අතර අන් අය දරුනු ලෙස පිලිස්සීමට ලක්ව තිබේ.

පිපිරුම් හතරෙන් පසුව බ්‍රිතාන්‍ය පොලීසිය පුපුරා නොගිය බෝම්බ දෙකක් සොයා ගෙන ඇතැයි එක්සත් ජනපද නිලධාරීන් ඒබීසී ප්‍රවෘත්ති සේවයට පවසා තිබේ.

මෙම ප්‍රහාර සිදු වූයේ අධිරාජ්‍යවාදයට හා යුද්ධයට එරෙහිව අනේක විධ විරෝධතා ව්‍යාපාර පැවති නගරයක වීම මගින් මෙම සාහසික ක්‍රියාවල සාපරාධී ස්වභාවය අවධාරනය කෙරෙයි. 2003 පෙබරවාරියේ දී, ඉරාකය ආක්‍රමනය කිරීමේ එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය සැලසුම්වලට විරෝධය පෑම පිනිස මිලියනයකට අධික ජනයා ලන්ඩනයේ පෙලපාලි දැක්වූහ.

බෝම්බ ප්‍රහාර සිදු කරනු ලැබුවේ ඉස්ලාමීය ත්‍රස්තවාදී සංවිධානයක් මගින් යැයි එලිදරව් වුව හොත්, එය එවන් කන්ඩායම්වල ප්‍රතිගාමී හා දේශපාලනිකව බංකොලොත් ස්වභාවය පිලිබඳ තවත් ලේ වැකි සාක්ෂියක් සපයනු ඇත. ත්‍රස්තවාදය අධිරාජ්‍යවාදයට බාධා පමුනුවන්නේ නැත. ඒ වෙනුවට, එය භීතිය, වෛරය, ව්‍යාකූලත්වය හා දේශපාලන අවමංගතවීම පතුරුවයි. ඒ සියල්ල ම සේවය කරන්නේ ලන්ඩනයේ හා වොෂිංටනයේ දේශපාලන ප්‍රභූන්ගේ ද ඔවුන්ගේ කීකරු මාධ්‍යවල ද අත් ශක්තිමත් කරනු සඳහා ය.

කෙසේ වෙතත්, මේ අවස්ථාවේ දී, මෙම ප්‍රහාර සිදු කලේ කවරෙක් ද යන්න නිවැරැදිව නිර්නය කිරීම කල නො හැකි ය. "යුරෝපයේ අල් කයිඩා රහස් සංවිධානය" යන නමින් තමන්ව හඳුන්වා ගන්නා කන්ඩායමක්, බෝම්බ පිපිරීම් ඉරාකය හා ඇෆ්ඝනිස්තානය තුල බ්‍රිතාන්‍ය මැදිහත්වීමට පලිගැනීමක් යැයි පවසන නිවේදනයක් ඉස්ලාමීය වෙබ් අඩවියක පල කරමින්, ප්‍රහාරයේ වගකීම භාර ගෙන තිබේ. එහෙත් මෙම කන්ඩායම ගැන මීට පෙර කිසිදාක අසා නොතිබුනු අතර සමහර විශේෂඥයන් වෙබ් අඩවියේ පල කෙරුනු නිවේදනයේ විශ්වාසනීයත්වය ප්‍රශ්න කර තිබේ.

බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්, එක්සත් ජනපද ජනාධිපති ජෝරජ් බුෂ් සහ ස්කොට්ලන්තයේ ජී-8 සමුලුව සඳහා රැස්වන සෙසු රාජ්‍ය නායකයන්, යුද්ධය හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට ප්‍රහාර එල්ල කිරීම පිලිබඳ සිය පිලිවෙත් යුක්තියුක්ත කිරීමේ ප්‍රයත්නයක් වෙනුවෙන් මෙම සාහසික ක්‍රියාවන් ඩැහැගැනීම ඒ පිලිබඳ තොරතුරු මඳකම මගින් වලකනු ලැබ නැත.

ග්ලෙනීගල්ස්හි සමෘද්ධිමත් පරිසරයේ සිට කතා කල, බ්ලෙයාර් සහ බුෂ්, ස්වකීය අරමුනු වෙනුවෙන් බෝම්බ ප්‍රහාර යොදා ගැනීමට පසුබට වූයේ නැත. බ්ලෙයාර්, ජී-8 සමුලුවේ වැඩකටයුතු ඉදිරියට යන බව අවධාරනය කිරීමට පලමුව, විපතට පත් වූවන් හා ඔවුන්ගේ පවුල්වල සංවේගයන් සිහි කිරීම පිනිස මඳකට නතර වූවා පමනි. බ්ලෙයාර්ට අනුව, බෝම්බ ප්‍රහාර "විශේෂයෙන් ම ම්ලේච්ඡ" ක්‍රියාවක් වූයේ, "අප්‍රිකාවේ දරිද්‍රතාව පිලිබඳ ගැටලු සහ දේශගුනික වෙනස්කම් හා පරිසරය පිලිබඳ දිගු කාලීන ගැටලු විසඳාලීමේ උත්සාහයක් ලෙස මිනිසුන් රැස්වන දිනයක ඒවා සිදු වූ" බැවිනි.

බුෂ්, ත්‍රස්තවාදීන්ගේ දුෂ්ටත්වයත් "දරිද්‍රතාව අඩු කිරීමට, ලෝකය ඒඩ්ස් වසංගතයෙන් ගලවා ගැනීමට (හැබෑටම) සහාය දීමට හා පිරිසිදු පරිසරයක් ඇති කිරීමට" වැඩ කරන ජී-8 නායකයනුත් අතර පවත්නා වෙනස ලෙස තමන් කියාපාන දෙය ද අවධාරනය කලේ යඃ

"මානව අයිතීන් හා මානව නිදහස ගැන ගැඹුරින් ම තකන අපගේත් ඝාතනයන්හි යෙදෙන, අහිංසක සාමාන්‍ය ජනයාගේ ජීවිත බිලි ගන්නා තරමට සිය හදවත් දුෂ්ටත්වයෙන් පුරවා ගෙන සිටින අයගේත් අභිප්‍රායන් හා හදවත් අතර පවත්නා පරස්පරයන් මීට වඩා පැහැදිලි කල නො හැකි ය." යනුවෙන් කියා ගෙන ගිය ඔහු ඉන් පසුව "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය ඉදිරියට යන" බව ප්‍රකාශ කලේ ය.

ජී-8 සමුලුව නිල නිවේදනයක් නිකුත් කරමින්, රැස්ව සිටින රාජ්‍ය නායකයන් "වඩා හොඳ ලෝකයක් වෙනුවෙන් වූ අපගේ සාකච්ඡාවන් ඉදිරියට ගෙන යන" බවට අවධාරනය කලේ ය. "මෙහි පැවැත්වෙන මෙම සමුලුවේ දී, ලෝක නායකයෝ, ලෝකයේ දරිද්‍රතාවට එරෙහිව සටන් වැදීමේ ද මානව ජීවිතය රැක ගැනීමේ හා වැඩිදියුනු කිරීමේ ද ප්‍රයත්නයක යෙදෙති."

ජාත්‍යන්තර මාධ්‍ය මෙම නිවේදන වහාම ඩැහැගෙන තොර තෝංචියක් නැතිව ඒවා වමාරන්ට පටන් ගෙන ඇත.

දුසිම් ගනන් ජනයා දරුනු ලෙස තුවාල ලබා ඇති සහ සිය ආදරනීය ඥාතිමිත්‍රයන්ගේ වියොව පිලිබඳ භයංකර පුවත පවුල් වෙත ලැබෙමින් පැවති අවස්ථාවක ඔවුන්ගෙන් කිසිවෙකු හෝ ඇසීමට අකමැති දෙය වූයේ ජී-8 සංවිධානයේ ප්‍රධාන නරුමයන්ගේ හා කුහකයන්ගේ ආත්ම-ලාඝී සම්පප්‍රලාපයන් ය.

© www.wsws.org